**රේගු දෙපාතර්මේන්තුවේ රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදල - 2025**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රේගු දෙපාර්තමේන්තුවේ රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් සහ වියදම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2025දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් ඉක්මවා යාම වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| + | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01හි 27 වන ඡේදය ප්‍රකාරව ගනුදෙනු, අනෙකුත් සිදුවීම් සහ තත්ත්වයන්ගේ බලපෑම් විශ්වාසනීය හා සාධාරණ ලෙස නිරූපණය කිරීම අවශ්‍ය වන බැවින් ඒ සඳහා ආයතනය විසින් ස්වකීය ආදායම්, වියදම්, වත්කම්, වගකීම් පිළිබඳව නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු වුවද, අරමුදලට අදාළව වෙනම මුදල් පොත්, සේවා ආදායම් ලෙජර, විකුණුම් ලෙජර හා අතිකාල ණයගැති ලෙජර පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේ දී පරිගණක භාවිතා කරමින් Excel පැතුරුම්පත් මගින් සිදු කරනු ලබන කටයුතු වෙනුවට ලෙජර් පොත් පවත්වාගෙන යාම සඳහා අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. | අරමුදලේ සියලුම ගනුදෙනු නිසි පරිදි හඳුනාගෙන හා වාර්තා කිරීම සඳහා අදාළ මූලික පොත්, වාර්තා හා ලෙජර විධිමත්ව පවත්වාගෙන යා යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයන්ට අදාළව සමාලෝචිත වර්ෂයේදී ගුවන් සමාගම් හා නැව් සමාගම්වලින් අයකර තිබූ රු.39,816,451ක ගාස්තු සමාලෝචිත වර්ෂයේ අතිකාල ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මූල්‍ය ප්‍රකාශනවල කොටසක් ලෙස පමණක් පවත්වාගෙන යනු ලබන මෙම අරමුදලෙහි මූල්‍ය සැකැස්ම විශේෂයෙන් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර සැසඳුම් හා අභ්‍යන්තර පාලනයේ කොටසක් ලෙස කරනු ලබයි. | අදාළ ගිණුම් කාලපරිච්ඡේදයට අයත් ආදායම් පමණක් එම වර්ෂයේ ආදායම් ලෙස නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2025 දෙසැම්බර් 31 දිනට රේගු නිලධාරීන්ට හා ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන ගාස්තුවල එකතුව රු.2,496,000ක් වුවද, එම වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.3,744,000ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ගෙවිය යුතු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන ගාස්තු රු.1,248,000කින් අධිප්‍රමාණය වී තිබුණි. | 2024 වර්ෂයට අදාල ගෙවිය යුතු රු.4,992,000ක වටිනාකමින් 2025 වර්ෂයේදී රු.3,747,000ක් ගෙවා ඇත. එම ඉතිරි වටිනාකම වන රු. 1,248,000ක මුදල 2025 වර්ෂයේ ගෙවිය යුතු වටිනාකම තුල ඇතුළත්ව ඇත. | වර්ෂය අවසානයට ගෙවිය යුතු වටිනාකම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළව ගුවන් සමාගම් 07කින් ලැබිය යුතු එකතුව රු.3,088,500ක් සහ මගීන් කැටුව නොඑන ගමන් බඩු නිදහස් කිරීමේ මෙහෙයුම් කටයුතු සිදුකරන ආයතනයකින් ලැබිය යුතු රු.1,845,750ක් | ඉහත දෝෂයන් හඳුනාගෙන මේ වන විටත් නිවැරදි කිරීමට කටයුතු සිදුකර ඇත. | වර්ෂයේ ආදායම් හා සියලුම ණයගැති ශේෂයන් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය |

| | | | |
|---|---|---|---|
| | ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ ආදායම සහ වර්ෂය අවසානයේ ණයගැති ශේෂය එකතුව රු.4,934,250කින් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | | ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ගුවන් සමාගමක් වෙතින් රු.522,000ක් අයකරගෙන ඇති බවට වැරදීමකින් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ණයගැති ශේෂය එම වටිනාකමින් අවප්‍රමාණය වී තිබුණි. තවද, තවත් ගුවන් සමාගමකට නිකුත් කර තිබූ රු.1,447,500ක් වූ ඉන්වොයිස් වටිනාකම ණයගැති ලෙජරයේ රු.595,500ක් ලෙස සටහන් කර තිබීම හේතුවෙන් රු.852,000කින් සමාලෝචිත වර්ෂයේ ආදායම හා ණයගැති ශේෂය අවප්‍රමාණය වී තිබුණි. | අඩුවෙන් සටහන් කර තිබූ ඉන්වොයිසි වටිනාකම් හා ගණිතමය දෝෂයක් හේතුවෙන් සිදුවූ රු.852,000ක වෙනස නිවැරදි කිරීමට මේ වන විට කටයුතු කර ඇත. | ණයගැති ශේෂයන් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී ගුවන් සමාගම් 03කින් අයකර තිබූ රු.1,041,000ක මුදලක් ලෙජරයේ ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් වර්ෂය අවසානයේ ණයගැති ශේෂය එම වටිනාකමින් අධිප්‍රමාණය වී තිබුණි. | අදාල ලැබීම් අතපසුවීමකින් ලෙජරයේ සටහන්ව නොතිබුණු අතර මේ වන විට අදාල ලැබීම් නිවැරදිව සටහන් කර ණයගැති ශේෂයන් යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත. | ණයගැති ශේෂයන් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්‍ා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය (රු.) | අනුරූපී වාතර්‍ා අනුව වටිනාකම (රු.) | වෙනස (රු.) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ණයගැතියෝ | | | | විගණනය විසින් පෙන්වා දෙන ලද පරිදි නිවැරදිව ණය ශේෂය හඳුනා ගැනීමට අදාලව ක්‍රමවේද සැකසීම සඳහා අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. | ණයගැති ශේෂයන්ගේ නොසැසඳීම් හඳුනාගෙන ඒවා නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| -නැව් සමාගම් | 2,076,000 | 4,037,568 | 1,961,568 | | |
| -ගුවන් සමාගම් | 1,121,100 | - | 1,121,100 | | |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු, තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන ගාස්තු | 1,531,222,936 | සේවයට වාර්තා කළ බව සනාථ කෙරෙන ඇඟිලි සළකුණු වාර්තා | රේගු දෙපාර්තමේන්තුවේ රේගු අතිකාල, ආයතන සංග්‍රහයේ ගාස්තු පිළිබඳව වන IX වන පරිච්ඡේදයේ 1.1 වගන්තියෙහි විධිවිධානවලට අනුකූලව බාහිර පාර්ශවයන් වෙතින් අය කරනු ලබන සේවා ගාස්තු මත පදනම්ව ගෙවනු ලැබේ. අතිකාල ගෙවීමට අදාල රේටයන් සඳහා මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අංක මු/1/රේගු/47/3 හා 2004.02.09 දිනැති ලිපිය මගින් වර්තමාන මාසික ඒකාබද්ධ වැටුපෙන් 240 න් කොටසක් ලෙස ගණනය කර ගෙවීම් කිරීමට අනුමැතිය ලබා දී ඇතත් එම රේටයන්ට වඩා අඩු රේටයකට දැනට ගෙවීම් සිදු කරනු ලැබේ. | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවලදී ලබාදී ඇති නිර්දේශ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව රේගු නිලධාරින් විසින් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු අතර වර්ෂයේ වියදම සනාථ කරගැනීම සඳහා එම වාර්තා විගණනයට ඉදිරිපත් කල යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය. | රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂණ ගාස්තු ගිණුමෙන් රේගු නිලධාරීන්ට ගෙවීම් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලැබූ ගෙවීම් ප්‍රමාණයන් හා පරිපාටියක් පැවතිය යුතු වුවද, එවැනි ගෙවීම් ප්‍රමාණයන් හා පරිපාටියක් අනුමත කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රේගු අතිකාල හා නැව් බඩු පරීක්ෂණ ගාස්තු ලෙස රු.1,518,243,736ක් නිලධාරීන්ට ගෙවා තිබුණි. | රේගු අතිකාල හා නැව් බඩු පරීක්ෂණ ගාස්තු ගිණුමෙන් රේගු නිලධාරින්ට ගෙවීම සඳහා මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ MF1/4/CUS/474 හා 2010.11.09 දිනැති ලිපිය මගින් අනුමැතිය ලබාගෙන ඇත. | තත්කාලීන ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව අදාල අනුමැතීන් නැවත ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2013 මාර්තු 01 දිනැති අංක 855, 2018 ඔක්තෝබර් 01 දිනැති අංක 1247 සහ 2024 සැප්තැම්බර් 25 දිනැති අංක 1664 දරන | 2004 වර්ෂයේ දී අනුමත කර තිබූ පැයක අතිකාල රේටය අවස්ථා 03 කදී පිළිවෙලින් සියයට 45 කින්, සියයට 50 කින් හා සියයට 50කින් වැඩිකිරීමට අතිකාල කමිටුවේ අවසාන නිර්දේශයට | අභ්‍යන්තර නියෝග අංක 855, 1274 හා 1664 මගින් අතිකාල රේට වැඩි කිරීම සිදු කරනු ලැබුවේ 2004.02.09 දිනැති මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ | අතිකාල රේටයන් සංශෝධනය කිරීමේදී අදාළ අතිකාල කමිටුවේ නිර්දේශ සහ මුදල් අමාත්‍යාංශයේ |

| | | | |
|---|---|---|---|
| දෙපාර්තමේන්තු නියෝගයන්. | යටත්ව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කර තිබුණ ද අතිකාල කමිටුවේ අවසාන නිර්දේශයන් ලද බවට හෝ මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලද බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවුණි. | අනුමැතිය ප්‍රකාරව වන අතර එමගින් වර්තමාන වැටුප පදනම් කර ගනිමින් අතිකාල ගෙවීමට අනුමැතිය ලබා දී තිබුණි.ඒ අනුව 2004 වර්ෂයේ සිට අතිකාල ප්‍රමාණය මේ දක්වා වරින්වර සංශෝධනය කර ගෙවීම් කළද 2004 වර්ෂයේ මුදල් අමාත්‍යාංශය ලබාදුන් අනුමැතිය ඉක්මවා කිසිදු අවස්ථාවක ගෙවීම් සිදු කර නොමැත. | අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.414,814,532ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.167,004,158ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.247,810,374 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිකාල ගෙවීම් රු.451,682,462 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රේගු හා අනෙකුත් සේවාවල නිලධාරීන් විසින් අතිකාල සේවයේ නිරතවීම සම්බන්ධයෙන් සිදුකල නියැදි විගණන පරීක්ෂාවේදී, ශ්‍රී ලංකා රේගුවේ අංශ 05 ක නිලධාරීන් 09 සිට 77ක් දක්වා පිරිසක් 2025 දෙසැම්බර් මාසයේ සති අන්ත නිවාඩු දින 10 කදි "රේගු 221" අතිකාල ලේඛනයේ අත්සන් තබා එකතුව පැය 18,225ක් අතිකාල සේවයේ නිරත වූ බවට සඳහන් කරමින් අතිකාල දීමනා ලබාගෙන තිබුණද, එකී දිනවලදී එම අංශ රාජකාරි කටයුතු සඳහා විවෘත කර නොතිබූ බව යතුරු භාරදීමේ හා භාරගැනීමේ ලේඛනය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද, එම අංශවල නිලධාරීන් 2025 දෙසැම්බර් 15 සිට 19 දක්වා කාලය තුළ ප.ව. 4.45 සිට පසුදින පෙ.ව. 8.00 දක්වා අතිකාල රාජකාරියේ නිරත වූ බවට "රේගු 221" අතිකාල ලේඛනයේ සටහන් කර තිබුණද, අදාළ කාර්යාල ප.ව. 4.30ත් ප.ව. 9.45ත් අතර කාලය තුළ වසා යතුරු භාරදී තිබූ බව යතුරු | රේගු දෙපාර්තමේන්තුවේ රේගු අතිකාල, ආයතන සංග්‍රහයේ ගාස්තු පිළිබඳව වන IX වන පරිච්ඡේදයේ 1.1 වගන්තියෙහි විධිවිධානවලට අනුකූලව බාහිර පාර්ශවයන් වෙතින් අය කරනු ලබන සේවා ගාස්තු මත පදනම්ව ගෙවනු ලබන අතර ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ අතිකාල ගෙවීමට අදාල රේටයන් සඳහා මුදල් අමාත්‍යාංශ ලේකම් අනුමත කළ රේටයන්ට වඩා අඩු රේටයකට දැනට ගෙවීම් සිදු කරගෙන යනු ලැබේ. | අතිකාල ගෙවීම සම්බන්ධයෙන් පවතින අභ්‍යන්තර පාලන ක්‍රමවේද ශක්තිමත් කර, පැමිණීම හා පිටවීම තහවුරු කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර ස්ථාපිත කිරීම කඩිනමින් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | භාරදීමේ හා භාරගැනීමේ ලේඛන අනුව තහවුරු විය. | | |
| (ආ) | 2017 පෙබරවාරි 27 දිනැති දෙපාර්තමේන්තු නියෝග අංක 1140 ප්‍රකාරව, රේගු නැව් බඩු පරීක්ෂණ ගාස්තු සඳහා හිමිකම් ලැබීමට සතියේ දිනවල පෙ.ව. 6.00ට පෙරද, සති අන්ත හා රජයේ නිවාඩු දිනවල පෙ.ව. 9.00ට පෙරද සේවයට වාර්තා කළ යුතු අතර, එසේ නොවන අවස්ථාවලදී එම ගාස්තු සඳහා හිමිකම් නොලැබිය යුතු වුවද, ශ්‍රී ලංකා රේගු කාර්යය මණ්ඩලයේ පැමිණීම/ පිටවීම සම්බන්ධයෙන් පවත්නා චක්‍රලේඛවලට අනුව හෝ තහවුරු කර ගැනීමකින් තොරව 2012 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා රු.3,674,877,847 ක් නැව් බඩු පරීක්ෂණ ගාස්තු වශයෙන් ගෙවා තිබුණි. | ගෙවන ලද මුදල රේගු 221 යන ආකෘති පත්‍රය අනුව නිසි පරිදි අධීක්ෂණය කරනු ලබන අතර එම වටිනාකම, නිර්දේශ කර අදාළ වගකිව යුතු නිලධාරීන්ගේ අනුමැතිය යටතේ නිරවද්‍යතාවය තහවුරු කරගෙන පමණක් ගෙවීම් සිදුකර ඇත. | රේගු නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම නිවැරදිව තහවුරු කර ගැනීමට ඇඟිලි සලකුණු යන්ත්‍ර ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් කඩිනමින් අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) | අතිකාල අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු ණයගැති ශේෂය රු.89,429,545ක් වූ අතර, එයින් නැව් සමාගම් 17කින් හා ගුවන් සමාගම් 18කින් අයවිය යුතු එකතුව රු.9,582,100ක් වූ ණයගැති ශේෂයන් 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයවීමකින් තොරව පැවති බව නිරීක්ෂණය විය. මෙලෙස දීර්ඝ කාලයක සිට අයවීම අවිනිශ්චිතව පවතින ණයගැති ශේෂයන්ගේ අයකර ගැනීමේ හැකියාව පිළිබඳ විධිමත් ඇගයීමක් තොරව හා පිළිගත හැකි ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානයට පැවති මුළු ණයගැති ශේෂයෙන් සියයට 03ක් එනම් රු.2,682,886ක් පමණක් අඩමාණ ණය ලෙස වෙන්කර තිබුණි. | 2019 වසරේ සිට 2024 දක්වා කාලයට අදාල රු.9,582,100ක් වූ ණයගැති වටිනාකමින් රු.2,209,425ක ප්‍රමාණයක් විගණන විමසුමට පිළිතුරු සපයන දිනය(2026.06.05) වන විට අයකර ගෙන ඇත. තවද ණයගැති කාල විශ්ලේෂණය පදනම් කරගෙන 2025 වර්ෂය අවසානයට පවතින මුළු ණයගැති ශේෂය මත මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිය මත අඩමාන ණය ඇස්තමේන්තුව සිදුකර ඇත. | දීර්ඝ කාලයක් තිස්සේ පවතින හිඟ ණයගැති ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට පියවර ගත යුතු අතර, ණයගැතියන්ගේ අයකර ගැනීමේ හැකියාව පිළිබඳ විධිමත් ඇගයීමක් සිදුකර, ඒ අනුව ප්‍රමාණවත් අඩමාණ ණය ප්‍රතිපාදන සිදු කළ යුතුය. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රේගු දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් 2019 මාර්තු 07 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී රේගු දෙපාර්තමේන්තුවේ සියලු නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම වාර්තා කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු බවට ලබාදී තිබූ නියෝගය ප්‍රකාරව, 2020 වර්ෂයේදී රු.594,960ක් වැය කර ඇඟිලි සලකුණු යන්ත්‍ර 04ක් ස්ථාපිත කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම යන්ත්‍ර භාවිතයට ගෙන නොතිබීම හේතුවෙන් ඌන උපයෝජිතව පැවති බව නිරීක්ෂණය විය. තවද, | රේගුව තුල නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර ස්ථාපිත කිරීමට අදාළ කටයුතු දැනටමත් ආරම්භ කර ඇති අතර ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් පැමිණීම හා පිටවීම සටහන් කිරීමට අපහසු මට්ටමේ ක්ෂේත්‍ර රාජකාරී පැවරී ඇති නිලධාරීන් සඳහා සුදුසු ප්‍රායෝගික විසඳුමක් පිළිබඳව ද අවධානය යොමු වී ඇත. | 2019 මාර්තු 07 දින හා ඉන් පසුව පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවලදී ලබාදී ඇති නිර්දේශ පරිදි රේගු නිලධාරින් විසින් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතුය . |

එම යන්ත්‍රවල මෘදුකාංග යාවත්කාලීන කිරීම සඳහා වැය කළ රු.107,706ක මුදලද අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොදෙන වියදමක් බවට පත්ව තිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අරමුදලේ ඇස්තමේන්තුගත සමස්ත ආදායම රු.1,934,085,374ක් වුවද, උපයාගත් සත්‍ය ආදායම රු.1,525,620,362ක් වීම හේතුවෙන් ඇස්තමේන්තුගත ආදායමට සාපේක්ෂව රු.408,465,012ක හෙවත් සියයට 21ක අහිතකර විචලනයක් පැවති බව නිරීක්ෂණය විය. නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන ගාස්තු ආදායම් ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා උපයා තිබුණද, රේගු අතිකාල ආදායම ඇස්තමේන්තුගත ආදායමට සාපේක්ෂව සියයට 30කින් එනම් රු.485,668,247කින් අඩුවීම සමස්ත අහිතකර විචලනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. | මේ සඳහා හේතු වී ඇත්තේ, අපේක්ෂිත පරිදි නැව් නොපැමිණීම, දේශගුණික, කාලගුණික සාධක හේතුවෙන් ගුවන් යානා පැමිණීම සීමාවීම, ගෝලීය වශයෙන් සිදුවන විචල්‍යතා හේතුවෙන් භාණ්ඩ ආනයන හා අපනයන කටයුතු වල සීමා ඇතිවීම වැනි ප්‍රමාණාත්මක හා ගුණාත්මක සාධකවල සෘණාත්මක බලපෑම බව නිරීක්ෂණය කරමි. | හැකිතාක් දුරට නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු සකස් කිරීමටත් ඒ අනුව වියදම් පාලනය කිරීමටත් කටයුතු කල යුතුය. |